ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016-0[illegible]-09

පැමිණිලිකරු : පී.ඩබ්.ඩී. විමුක්ති නවාංජන තිලකරත්න මයා.
අංක 203/1, පැලහැල,
දොම්පේ.

වගඋත්තරකරුවන් : 01. මොරගොඩ ලියනගේ ගුණතිලක පිංතු මයා,
ගම්/ බණ්ඩාරනායක විද්‍යාලය,
ගම්පහ.

02. විදුහල්පති,
ගම්/ බණ්ඩාරනායක විද්‍යාලය,
ගම්පහ.

03. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,
කලාප අධ්‍යාපන කාර්යාලය,
ගම්පහ.

<u>පැමිණිලි අංකය : **HRC/1622/15/I-23**</u>

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකරු වන පී.ඩබ්.ඩී. විමුක්ති නවාංජන තිලකරත්න යන අය (වයස අවුරුදු 18) වගඋත්තරකාර ගම්/බණ්ඩාරනායක විද්‍යාලයේ 12 ශ්‍රේණියේ ඉගෙනුම ලැබූ බවත්, එසේ ඉගෙනුම ලබමින් සිටියදී 2015.04.07 දින ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය හා ලුම්බිණි විද්‍යාලය අතර පාසල් ක්‍රිකට් තරගය පැවැත්වූ බවත්, තමා එදින තිල ඇඳුමින් විදුහල්පතිතුමාගේ අවසරය සහිතව එම අවස්ථාව ඡායාරූප ගැනීම සඳහා සහභාගි වූ බවත්, ඒ අනුව එම අවස්ථාවට අදාලව ඡායාරූප ගැනීම අවසන් කර තරගය නැරඹීමේදී ආදි ශිෂ්‍යයින් පිරිසක් විසින් ආරවුලක් ඇති කල බවත්, එහිදී විනය භාර ගුරුතුමා වන පිංතු ගුණතිලක ගුරුතුමා එම ස්ථානයට පැමිණ තරමක් එහායින් සිටි තමාට කථා කර තමාගේ කණට පහරවල් 02ක් ගැසූ බවත් සඳහන් කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

එසේම තමාගේ කැමරාව ඇතුළු ආම්පන්න එම ස්ථානයට ගොස් ගෙන ඒමට ඉල්ලා සිටියදී නැවත කණට ගැසූ බවත්, කණෙන් ලේ වහනය වූ බවත්, එවිට තමා පහත මාලයේ සිටි ගුරුවරයකුට මේ බව පැවසීමේදී පිංතූ ගුරුතුමා තවත් පහරක් කණට ගැසූ බවත් සඳහන් කර ඇත.

තමා මේ පිළිබඳව විදුහල්පතිතුමාට දැනුම්දුන් නමුත් පියවරක් නොගත් බවත්, ඒ අනුව කිසිදු පියවරක් නොගත් නිසා මිතුරෙකු සමග කොළඹ ජාතික රෝහලට ඇතුළත් වූ බවත්, තමා 2015.04.07, 08 සහ 09 දිනවල නේවාසිකව ප්‍රතිකාර ගත් බවත් 2015.04.19 වන දින පොලිස් ස්ථානයට මගින් කැඳවා සිද්ධිය සමථ මණ්ඩලයට යොමු කළ බවත් සඳහන් කර ඇත.

තමා පාසලින් 2015.04.23 දින අස්වීම් සහතිකය ලබාගැනීමට ඉල්ලීමෙන් පසුව ලියුමක් ලියා ගැනීමෙන් අනතුරුව අස්වීම ලබා දුන් බවත්, තමා හදාරන විෂය ධාරාව සඳහා වෙනත් පාසලක් ලබා ගැනීම හා පාසල වෙත ලබා දුන් පරිත්‍යාග මුදල් නැවත ලබා ගැනීමත්, පහරදුන් ගුරුතුමා සම්බන්ධව කටයුතු කිරීමත් සහනය ලෙස බලාපොරොත්තු වන බවත් දක්වා ඇත.

**පළවන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-**

තමා 1985 - 2002 වර්ෂය දක්වාත් 2004 සිට මේ දක්වා විදුහලේ සහකාර විදුහල්පති විෂය සමගාමී හා විනය භාර ගුරුතුමා ලෙස කටයුතු කරන අතර 2015.04.07 දින තම පාසලේ හා ලුම්බිණි පාසල අතර පැවති ක්‍රිකට් තරගයේදී පෙ.ව. 11.00 ට පමණ යම් කලබලකාරී තත්ත්වයක් උද්ගත වූ බවත්, පසුව එය සමනය වී නැවත 12.20 ට පමණ තරඟන්නන් අතර කලබලයක් ඇති වූ බවත් ආදි සිසුන් හා පාසල් සිසුන් අතර ඇති වූ කලබලයක් බවත් පොලිස් නිලධාරීන් ගුරුවරුන් ගොස් එය සමථයට පත් කළ බවත්, එම සමථයෙන් විනාඩි 10 කට පසු තමා එම ස්ථානයට ගිය බවත් සඳහන් කර ඇත.

ඒ වනවිට කලබලය අවසන්ව තිබූ අතර ඒ අතර පුද්ගලික ඇඳුමින් හා පාසල් ටීෂර්ට් එකකින් සැරසී සිටි ආදි සිසුන් අතර පාසල් ඇඳුමින් සිටි සිසුන් තිදෙනෙකු සිටි බවත්, ආදි සිසුන් මත්පැන් පානය කර සිටින බව තමාට හැඟී ගිය බවත් පාසල් සිසුන් අතර සංගීත භාණ්ඩයක් තිබූ අතර එම දර්ශනය නොගැළපෙන දර්ශනයක් වූ හෙයින් තමා ඔවුන් තිදෙනාට පාසල් ළමුන් සිටිනා ස්ථානයට යන ලෙස දැනුම් දුන් බවත් සඳහන් කර ඇත.

සංගීත භාණ්ඩය රැගත් සිසුවා "අපි මෙතන හිටපුවාහම මොකද වෙන්නේ " යනුවෙන් තමා සමග වාද කළ බවත් තමා ඔහුට තදින් අවවාද කළ විට සංගීත භාණ්ඩයද එම ස්ථානයේ තබා ගිය බවත් තමා නැවත ඔහුට කථා කර සංගීත භාණ්ඩය ඔහු අතට දී පාසල් සිසුන් සිටින ස්ථානයට යන ලෙසට අවවාද කළ බවත් දක්වා ඇත.

එම ස්ථානයේ පාසල් ගුරුවරුන් 10 දෙනෙකු රැඳී සිටි අතර පැය 03 කට පසු එම සංගීත භාණ්ඩය රැගෙන ගිය සිසුවා වන විමුක්ති නවාංජන තිලකරත්න සිසුවා තමා සිදු කළ පහර දීමක් මත ඇති වූ තත්ත්වයට ප්‍රතිකාර ගැනීමට ජාතික රෝහලට ඇතුළත් වී ඇති බවට තමාට දැනගැනීමට ලැබුනු බවත් පසුව තමා වෙත ලද දුරකථන ඇමතුමකට අනුව මාලිගාවත්ත පොලිස් ස්ථානයට ගොස් ප්‍රකාශයක් ලබා දුන් අතර පසුව පොලිස් ඇප මත මුදා හළ බවත්, සමථ මණ්ඩලයේ සමථ නොවීම මත අධිකරණයට ඉදිරිපත් කළ බවත් දක්වා ඇත.

තවදුරටත් දක්වා ඇත්තේ තමා කිසිදු ආකාරයක පහරදීමක් නොකළ අතර ඇතිවූ කලබලකාරී තත්ත්වය පාලනය කිරීම සඳහා මැදිහත්වීමක් වීම පමණක් සිදුකරන ද බවයි.

**දෙවන වගඋත්තරකරුගේ වාර්තාව :-**

මෙම පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් දෙවන වගඋත්තරකාර විදුහල්පතිවරයා විසින් සඳහන් කර ඇත්තේ, 2015.04.07 දින පැවති පාසල් ක්‍රිකට් තරගයේදී ආදි සිසුන් හා පාසල් සිසුන් අතර ගැටුමක් සිදු වී පසුව එය සමථ වී ඇති බවත් එම ස්ථානයේ ආදි ශිෂ්‍යයන් බීමත්ව සිටි නිසා මෙම ශිෂ්‍යයාද ඉන් ඉවත් කර ගෙන ඇති බවත්, විනය මණ්ඩලයේ කටයුතු කරන එම්. එල්. ගුණතිලක පිංතූ මහතාද එම ස්ථානයට පැමිණ ඇති බවත්, පසුව මෙම සිසුවා එම්.එල් ගුණතිලක පිංතූ මහතා පහර දුන්නේ යැයි තමාට දැන්වූ බවත්ය.  තමා ඒ පිලිබඳ විමසා බලා නැවත සිසුවා පිලිබඳ සොයා බැලීමේදී ඔහු ක්‍රීඩාගාරයේ නොමැති බව වාර්තා වූ අතර තමා ඒ පිලිබඳ සොයා බැලීමට පන්ති භාර ගුරුවරයෙකුට දැනුම් දුන් බවත් සඳහන් කර ඇත.

පසුව ඔහු රෝහල් ගතව ඇති බව දැනගැනීමට ලද බැවින් ඔහු බැලීමට ගුරුවරුන් හා වැඩිහිටි සිසුන් ගිය අතර එහිදී එම සිද්ධිය පොලිස් ස්ථානයට යොමුවීම නිසා තමන් නිහඬ වූ බවත් සඳහන් කර ඇත.

මේ අතරතුර සිද්ධියට අදාළ සිසුවා පාසලෙන් අස්වීමට පැමිණි අතර දරුවාගේ අනාගත අභිවෘද්ධිය සළකා බලා කටයුතු කරන මෙන් මවට දැන්වූ බවත්, ඒ පිලිබඳ නැවත අවස්ථාව දෙනු වස් එදින අස්වීම් සහතිකය ලබා නොදුන් නමුත් පසුදින ඔවුන් පැමිණ අස්වීම ඉල්ලූ බැවින් මේ පිලිබඳව ගම්පහ කලාප අධ්‍යාපන අධ්‍ය.ක්‍ෂතුමාගේ උපදෙස් ලබා ගැනීමෙන් පසු එම උපදෙස් මත දෙමාපියන්ගෙන් ලිපියක් ලබාගෙන අස්වීම් සහතිකය ලබා දුන් බවත්,  සඳහන් කර ඇත.

පසුව ඔවුන් පාසල විසින් බලහත්කාරයෙන් ලිපියක් ලබාගෙන අස්වීම දුන් බවට පොලිස් පැමිණිල්ලක් කර ඇති බවද ශිෂ්‍යයා පාසලට ඇතුළත්වීමේදී පාසලට ගෙවන ලද පහසුකම් හා සේවා ගාස්තු හා පරිත්‍යාග එම අවස්ථාවේ ඉල්ලා නොසිටි බවද එම මුදල් අධ්‍යාපන අධ්‍යක්‍ෂකගේ උපදෙස් පරිදි ගෙවීමට හැකි බවද පාසලින් අස්වීම ලබාගැනීමෙන් පසුව කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ පාසලක් ලබාදීමට එකග වී ඇති බවද වැඩිදුරටත් දක්වා ඇත.

නිරීක්ෂණ :-

2015.04.07 දින ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය හා ලුම්බිණි විද්‍යාලයේ ක්‍රිකට් ක්‍රීඩා තරගය පැවැත ඇති අතර එදින පැමිණිලිකාර සිසුවා පාසල් නිල ඇඳුමින් ඊට සහභාගී වී එම අවස්ථාව ඡායාරූප ගත කිරීම් කර ඇති බවත්, ඒ සඳහා 2015.02.13 දින පොදුවේ පරිගණක සංගමය විසින් නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට පාසැල් විවිධ අවස්ථා ඡායාරූප ගත කිරීමට නිල අවසරය මෙම පැමිණිලිකාර සිසුවා විසින් ලබා ගෙන ඇති බවත්, අදාළ ලේඛන පරීක්ෂාවේදී නිරීක්ෂණය වී ඇත.

එම ක්‍රීඩා තරගය අතර යම් අරගල තත්ත්වයක් මතු වූ බව දෙපාර්ශවයට කරුණු දැක්වීමේදී පිළිගෙන ඇති අතර එම තත්ත්වය මැඩ පැවැත්වීමට පාසලේ විනය මණ්ඩලය භාර පළවන වගඋත්තරකරු එම ස්ථානයට ගිය බව ඔහු ලබා දුන් දිවුරුම් ප්‍රකාශය හා විදුහල්පතිගේ 2015.07.07 දාතම වාර්තාව මගින් පිළිගෙන ඇත.

එම අවස්ථාවේ මෙම පැමිණිලිකරුද ඉහත මාලයේ සිටි බව දෙපාර්ශවයේ කරුණු අනුව නිරීක්ෂණය වේ.

ඒ අවස්ථාවේ මෙම පැමිණිලිකරු පාසල් නිල ඇඳුමින් සිටි බව වගඋත්තර පාර්ශවය පිළිගන්නා අතර, පළවන වගඋත්තරකරු විසින් ඔහුට කරන ලද දැනුම්දීම් පිළිනොගෙන වාද කිරීම නිසා තදින් අවවාද කළ බවත්, නැවත කැඳවා ඔහු විසින් දමා ගිය සංගීත භාණ්ඩය ලබා දී පහළට යන ලෙස දැන්වූ බව දක්වා ඇත ඒ අනුව පැමිණිලිකරු හා පළවන වගඋත්තරකරු අතර යම් සිදුවීමක්, හමුවීමක් වූ බව නිරීක්ෂණය වේ.

එය පැමිණිලිකරු දක්වා ඇත්තේ කණට පහරදීම් කීපයක් කළ බවත්, කැඳවා නැවත පහර දුන් බවත්ය. ඒ අනුව පැමිණිලිකරුට එම පහරදීමකට අදාළව රෝහල්ගතව ප්‍රතිකාර ගත් බවත් දැක්වීම අනුව අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවා ඇත. එම වාර්තාවට අනුව

01. වම් කණේ පිටත 0.4x 0.3 cm තරම් ප්‍රමාණයක සීරීම් තුවාලයක් (antihelix region)

02. වම් කණේ පිටත 2 x 3 cm වූ තරම් ප්‍රමාණයක සීරීම් තුවාලයක් (over the tragus)

03. පිටත ශ්‍රවණාලියහි සීරීමක් (external auditory Canal) හා පටහා පටලයේ (Tympanic membrane) පිටුපස ලේ කැටිත්තක් ඇති බවත් හා පටහා පටලය පිඩාවට (intact) පත් වීමක් දක්නට නොමැති බවත් දක්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරු දක්වන පහර දුන් ආකාරය එම තුවාල සමග සැසඳෙන බවට නිරීක්ෂණය වේ.

එම අවස්ථාවේ පළවන වගඋත්තරකරු පහර දුන් බවට සිසුවා පැමිණිලි කල බව දෙවන වගඋත්තරකරු ලබා දුන් වාර්තාවෙන් පිළිගෙන ඇති නමුත් එම සිසුවාගේ පැමිණිල්ල පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් දෙවන වගඋත්තරකරු විසින් නොගත් බව නිරීක්ෂණය වේ. ඒ බව පොලිස් ස්ථානයේ පැමිණිල්ලෙහි ඇති බැවින් නිහඬ වූ බවට වාර්තාවෙන් පිළිගෙන ඇති බවද නිරීක්ෂණය වේ.

එසේම පහරදීම හේතුවෙන් පාසලට යාමට අකමැති සිසුවා පාසල් අස්වීම ලබා ගැනීම 2015.04.24 දින සිදු කර ගෙන ඇති නමුත් හා සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ 2015.07.08 දින පාසලක් ලබාදීම සම්බන්ධව කිසිදු ගැටළුවක් නොපැවති බව දැක්වූ නමුත් ඒ පිළිබඳ කටයුතු කල බව කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කිරීමට සමත්ව නොමැති බවද නිරීක්ෂණය වේ.

ඒ අනුව මෙම සිසුවාට දැඩි අවවාද කිරීමක් කල බවට පළවන වගඋත්තරකරු පිළිගෙන ඇතත් සිසුවාට සිදුවූ තුවාල සැලකීමේදී අවවාද කිරීමක් නොව පහරදීමක් සිදුවී ඇති බව පැහැදිලි වේ.

**නිගමනය :-**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි වගන්තිය යටතේ වන "කිසිම තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට භාජනය නොවී නිදහසේ ජීවත්වීමට" ඇති අයිතිය ගුරුවරුන් විසින් තහවුරු කළයුතු බව ***පරාක්‍රමගේ ඩග්ලස් බණ්ඩාර එදිරිව එස්. වික්‍රමසිංහ, නියෝජ්‍ය විදුහල්පති, බත්තරමුල්ල ශ්‍රී විභූති මධ්‍ය මහා විද්‍යාලය හා තවත් අය SC (FR) 190/94*** විනිශ්චිත නඩුවේදිද දක්වා ඇති අතර. ඒ අනුව පළවන වගඋත්තරකරු විසින් එම අවස්ථාව සිසුවාට අහිමි කර ඇති බව නිගමනය කළහැක. දෙවන වගඋත්තරකාර පාර්ශවයද එම ප්‍රතිපූරුෂ වගකීමට යටත් වේ.

***2005/17 චක්‍රලේඛනය*** මගින් පාසලේ විනය පවත්වා ගැනීමෙහිලා කටයුතු කළයුතු ආකාරය පිළිබඳ පැහැදිලිව දක්වා තිබියදී, පාසැල් විනය මණ්ඩල සභිකයෙකු විසින්ම එම චක්‍රලේඛනය උල්ලංඝනය කිරීම තුළින් දෙවන වගඋත්තරකරු පරිපාලනමය වශයෙන් එවන් අවස්ථා සඳහා ඉඩ ප්‍රස්ථා ලබාදී ඇති බව නිගමනය කළහැකි වේ. එසේම 3 වන වගඋත්තරකරු සිසුවාට පාසලක් ලබාදීම සම්බන්ධව කඩිනම් අප්‍රමාද පියවර ගැනීම වෙනුවට මන්දගාමීව කටයුතු කර ඇති බවද නිරීක්ෂණය වේ.

මෙකී කරුණු අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

1. මෙම කාරණය පිළිබඳව පළමුවැනි වගඋත්තරකරුට එරෙහිව දෙපාර්තමේන්තු මට්ටමින් විනය පියවර ගැනීමට කටයුතු කළ යුතු බවට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙයින් දන්වා සිටිමු.

2. එසේම පළමුවන වගඋත්තරකරු විසින් රු. 10,000/- ක වන්දි මුදලක් පැමිණිලිකරු වෙත ගෙවීමට කටයුතු කළ යුතුය. (අදාළ මුදල මුදල් ඇණවුමක් මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැලැස්විය යුතුය.)

3. එසේම පාසල තුළ විනය පවත්වා ගැනීම සඳහා වූ අංක 2005/17 දරණ චක්‍රලේඛනය විධිමත්ව හා නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සම්බන්ධව දීර්ඝකාලීන වැඩපිළිවෙලක් පාසල තුළ ඇති කිරීමට පියවර ගැනීමට හා ඒ පිළිබඳව කොමිෂන් සභාවට වාර්තා කිරීමට කටයුතු කළ යුතු බවට දෙවන වගඋත්තරකරුට හා තෙවන වගඋත්තර පාර්ශවයට දන්වා සිටිමු.

2016.09. 15 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :- ලේකම්, - ඉහත නිර්දේශයේ (1) පරිදි කටයුතු කිරීමට
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/83